**නාඋල ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**
**--------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3.3, 1.3.4, 1.3.5 යන ඡේද වල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). නාඋල මහජන ක්‍රීඩාංගනයේ වැට ඉදිකිරීම වෙනුවෙන් දරා තිබුණු රු.150,000ක වියදම් හා රු.32,350ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ආ). ඉකුත් වර්ෂ 11 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.375,208ක විගණන ගාස්තු හා සමාලෝචිත වර්ෂයට අදාල රු.110,488ක් වූ ණයහිමි ශේෂ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ). රු.47,585ක කර්මාන්ත රැඳවුම් මුදල පොදු තැන්පත් ගිණුමට සහ ණයහිමි ගිණුමට ඇතුළත් කර දැක්වීම නිසා ණයහිමි ශේෂය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.27,030ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.2,076,555කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු රු.71,668ක උසාවි දඩ මුදල නැවත ණයගැතියන් යටතේද දක්වා තිබුණි.

(ඊ). මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.9,512,641ක් වු අතර, වර්ෂ 03 කට වැඩි කාලයක් ඉක්මවූ රු. 330,784ක ශේෂයක් ද ඊට ඇතුලත් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.8,447,546ක් වු අතර, වර්ෂ 1ත් වර්ෂ 2ත් අතර කාලයට අයත් රු.47,500ක ශේෂයක්ද ඊට ඇතුලත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,487,789ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| -(i). 132 වගන්තිය. | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන අවස්ථා 02කදී රු.210,000ක වියදම් දරා තිබුණි. |
| (ii). 154(1)වගන්තිය | ඉඩම් වෙන්දේසි 02කට අදාලව සියයට 1ක බදු මුදල් රු.40,800 ක් අඩුවෙන් අයකර තිබුණු අතර ඉඩම් වෙන්දේසි 03කට අදාලව බදු මුදල් අයකර නොතිබුණි. |

**(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව**

-----------------------------------------

| | |
|---|---|
| **(i). 99 රීතිය** | **රු.37,064ක් සඳහා වූ සහතික නොකරන ලද වවුචර්පත් 07ක් සඳහා ගෙවීම් කර තිබුණි.** |
| **(ii). 207 හා 208 රීති** | **තරඟකාරි මිල කැඳවීමේ ක්‍රමයක් අනුගමනය කිරිමකින් තොරව ,ජේසීබී යන්ත්‍රයක් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් අවස්ථා 03කදී හා හියුම් පයිප්ප මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.113,970ක් හා රු.195,750ක් වැයකර තිබුණි.** |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,987,997ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,112,738ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,124,741ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 වරිපනම්

-----------

වර්ෂයේ බිල්කළ ආදායම්වලින් රු.1,048,546ක් හා ඉකුත් වර්ෂවලට අදාල හිඟ ශේෂවලින් රු.841,262ක් වශයෙන් එකතුව රු.1,889,808ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබුණි.

2.2.2 බදුකුලී

---------

පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ එක් කඩ කාමරයක් නීත්‍යානුකූල ගිවිසුමක් නොමැතිව රු.1,500ක මාසික කුලි පදනම මත කුලියට දී තිබුණු අතර මාස 11 කට අදාල රු.16,500ක හිඟ කුලී මුදල් අයකර ගැනීමට මෙන්ම විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. තවත් කඩකාමර 03ක් ගිවිසුම් වලට එළඹීමකින් හා කුලී අයකිරීමකින් තොරව වෙළඳ දැන්වීම් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා බාහිර පුද්ගලයෙකුට ලබා දී තිබුණි.

2.2.3 ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.319,362ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරිගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.172,585 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,475,000ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට මාසිකව දායක මුදල් ප්‍රේෂණය නොකිරිම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,923,445ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

(ආ). 1999 ජනවාරි 23 දින අනතුරකට පත්වී තිබුණු ඩබල් කැබ්රථය අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද වියදමින් රක්ෂණ හිමිකම් මගින් ආවරණය නොවු රු.152,200ක මුදල නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ "ඊ - නැණ පියස" තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා 2012 නොවැම්බර් 15 දින රු.607,617ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සභාව වෙත ලැබී තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුළ බලපත්‍ර නිකුත් කළයුතු වෙළඳසැල් සංඛ්‍යාව 548ක් ලෙස හඳුනාගෙන බලපත්‍ර ගාස්තු අයකරගෙන තිබුණු නමුත් ඉන් වෙළඳසැල් 160කට පමණක් බලපත්‍ර ලබා දී තිබුණි. ඉතිරි වෙළඳසැල් සඳහා බලපත්‍ර ලබා දී නොතිබුණු අතර, ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඉඩකඩ සලසා දි තිබුණි.

(ඉ). මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව රු.201,325ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ). සභාව සතු ඉඩම් දෙකක අනවසර පදිංචිකරුවන් විසින් භාවිතයට යොදවාගෙන තිබුණු නමුත් ඔවුන් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ). 2006 හා 2008 වර්ෂවලදී විකුණන ලද වෙන්දේසි ඉඩම් 05කින් ප්‍රාදේශීය සභාව වෙත පවරාගත යුතු සියයට 10 ක ඉඩම් ප්‍රමාණයට වඩා පර්චස් 245ක් අඩුවෙන් පවරාගෙන තිබුණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වටිනාකම රු.100,000ක් වූ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය වසර 10ක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බලප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ වලින් කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩ පිළිවෙලක් හෝ කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, ආදායම් විෂයයන් 12ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 23 සිට සියයට 93 අතර පරාසයක විචලනයක් ද ,වැය විෂයයන් 39කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර,සියයට 11සිට සියයට 98 දක්වා පරාසයක විචලනයන්ද පැවති අතර වැය විෂයයන් 12ක් සඳහා සලසාදී තිබූ රු.675,000ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හෝ ඉතිරි කිරීම සිදුකර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරික්ෂණාව විය.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්
----------------------------------------------------------

ගනුදෙනුවල වටිනාකම රු.599,353ක් වූ එක් විගණන විමසුමකට පිළිතුරු සපයා නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). හිඟ ආදායම් අයකර ගැනීම.
(ආ). අයවැය පාලනය.
(ඇ). වත්කම් කළමනාකරණය.
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.
(ඉ). ගබඩා පාලනය.
(ඊ). මූල්‍ය පාලනය.